දැන්වීමයි
කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ නගර ශාලා භාරකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා සිමීත බඳවා ගැනීම - 2026

ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2019.07.25 දින අනුමත කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ නගර ශාලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව, නගර ශාලා භාරකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් වෙතින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව කොළඹ මහා නගර සභාවේ ඔබ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු III ශ්‍රේණියේ නගර ශාලා භාරකරු තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලත් සේවක මහත්ම/මහත්මීන් සඳහා පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ ද සහිතව 2026.08.25 දිනට පෙර නාගරික ලේකම්, නාගරික ලේකම් දෙපාතර්මේන්තුව වෙත එවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. නගර ශාලා භාරකරු III වන ශ්‍රේණිය තනතුරු සඳහා කොළඹ නගර සභාවේ වසර 05 ක සක්‍රීය සේවයේ නියුක්ත, තනතුරේ ස්ථීර කර ඇති පහත සඳහන් සුදුසුකම් සහිත ප්‍රාථමික සේවා ගණයක(PL-1/PL-2 හා PL-3) සේවක /සේවිකාවන් හට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

I. තනතුරු නාම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ නගර ශාලා භාරකරු - III ශ්‍රේණිය

II. වැටුප් කේත අංකය: MN 1-2025 (රා.ප.ව.අංක 10/2025 අනුව 1 වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ)

III. මාසික වැටුප් පරිමාණය : **45230 – 10 X 540 – 11 X 630 – 10 X 890 – 10 X 1190 – 78360/=**
(වැටුප ගෙවනු ලබන්නේ රා.ප.ව. 10/2025 හි උපලේඛන 111 හි සඳහන් පරිදිය)

VI. මෙම තනතුර ස්ථීර විශ්‍රාම වැටුප් සහිතය.

V. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : භාෂාව හා ගණිතය ඇතුළුව අ.පොස. (සා.පෙළ)විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 6 කින් සමත් වී තිබීම.

VI. පළපුරුද්ද : කොළඹ මහ නගර සභාවේ PL-1/PL-2 හා PL-3 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථීර කරනු ලැබ ඇති වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර සේවා කාලය ආයතන ප්‍රධානියා විසින් සහතික කල යුතුය.

VII.කායික සුදුසුකම් : තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

VIII . වෙනත් :
(i) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට (2026.08.25 දිනට) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IX . වයස් සීමාව : අදාළ නොවේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත විභාගයක් පවත්වා ඉන් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

04. ලිඛිත විභාග :-

විෂය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු	අවම සමත් ලකුණු
<u>සාමාන්‍ය දැනීම</u> ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු දැනුවත් භාවය සහ අවබෝධය මැන බැලීම.	පැය 02	100	40%
<u>බුද්ධි පරීක්ෂණය</u> අපේක්ෂකයා සතු කරුණු නිවැරදි හා තර්කානුකූල ලෙස අවබෝධ කර ගැනීමේ බුද්ධිය හා ගණිතමය හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.	පැය 01	100	40%

05. විභාග ගාස්තු :- කොළඹ මහනගර සභාවේ 2025.01.28 දිනැති මූල්‍ය කළමනාකරණ කමිටුවේ තීරණ අංක 1137 පරිදි, කොළඹ මහනගර සභාව විසින් පවත්වනු ලබන විභාග සඳහා ගාස්තු අයකිරීම යටතේ,

(අ) කොළඹ මහනගර සභාවේ සේවයෙහි නියුතු,

- පළමුවර පෙනී සිටින අයදුම්කරුවන් හට විභාග ගාස්තු අය නොකෙරේ.
- දෙවන අවස්ථාවේ සිට
  සම්පූර්ණ විභාගය සඳහා රු. 500.00

මේ අනුව අදාළ මුදල් කොළඹ මහනගර සභාවේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ පරිපාලන ආදායම් ශීර්ෂ 7112015025 ගිණුමට බැරවන පරිදි කොළඹ මහනගර සභාවේ සරප් අංශය වෙත ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයෙහි ඇලවිය යුතුය.

2026.08.25 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අත්හැරීම් හා ප්‍රමාද දෝෂ පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුවේ විෂයභාර නිලධාරියා වෙත පැවරේ.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද කොළඹ මහනගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ඒ.ඩී.ඒස්.රෝහණ
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

2026. අගෝස්තු මස ..... වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.